# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2465/07 - 2025 දෙසැම්බර් මස 01 වැනි සඳුදා - 2025.12.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු 20 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 01 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි "**2025 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. දිට්වා සුළි කුණාටුවෙන් බලපෑමකට ලක් වූවන් සඳහා විදේශයන්ගෙන් පරිත්‍යාග කරන ලද භාණ්ඩ නිෂ්කාශනය කඩිනම් කිරීම සඳහා අන්තර්කාලීන ක්‍රියාමාර්ගයක් ලෙස මෙම රෙගුලාසි නිකුත් කරනු ලැබේ.

3. 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ප්‍රකාශයට පත්කර ඇති දැනට පවතින රෙගුලාසිවල කෙසේ සඳහන් වුවද, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශ ලේකම්වරයාගේ අවසරය යටතේ, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නමින් හෝ ඕනෑම රජයේ ආයතනයකට (තොග ලබන්නා) ඕනෑම විදේශීය රාජ්‍යයකින් (රජයන්), සංවිධානවලින් හෝ පුද්ගලයින්ගෙන් පරිත්‍යාග ලෙස ලැබෙන භාණ්ඩ ආනයනයන්, පහත සඳහන් පරිදි අදාළ ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවලින් නැවත දැනුම් දෙන තුරු නිදහස් කරනු ලැබේ;



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3.1 සංශෝධිත, 2023 ජනවාරි 01 දිනැති අංක 2312/77 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මගින්, ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවා ඇති භාණ්ඩ හැර ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවයට යටත් වන එවැනි භාණ්ඩ, ආනයන පාලන බලපත්‍රයක් නොමැතිව, රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින්;

අ. ASYCUDA පද්ධතිය හරහා ශ්‍රී ලංකා රේගුව සමග ඍජුවම සම්බන්ධ වී ඇති අදාළ රාජ්‍ය ආයතනයේ අනුමැතියට/ අවසර පත්‍රයට යටත්ව,

ආ. ඉහත 3.1 (අ) හැර අනෙකුත් අවස්ථාවන්හි දී ආනයන හා අපනයන පාලක ජනරාල් විමසීමෙන්; ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කළ යුතු ය.

3.2 සංශෝධිත, 2023 ජනවාරි 01 දිනැති අංක 2312/77 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මගින්, ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවයට යටත් වන නමුත් ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවා ඇති සංයෝජිත වර්ගීකරණ කේත 1006.30.19 සහ 1006.30.29 යටතේ වර්ගීකරණය කර ඇති එවැනි භාණ්ඩ රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කළ යුතු ය.

3.3 සංශෝධිත, 2023 ජනවාරි 01 දිනැති අංක 2312/77 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශෙෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මගින්, ආනයන තහනම් කර ඇති ලෙස ලැයිස්තුගත කර ඇති, සංයෝජිත වර්ගීකරණ කේත 8467.81 (දම්වැල් කියත්) සහ 3924.10.90 (එක් වරක් පමණක් භාවිත කරන ප්ලාස්ටික්) යටතේ වර්ගීකරණය කර ඇති එවැනි භාණ්ඩ පමණක් රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කළ යුතුය.

3.4 2024 මැයි 17 දිනැති අංක 2384/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන රෙගුලාසිවලට යටත්වන සහ මෙම *ගැසට් පත්‍රයේ* **I වන උපලේඛනයේ** ලැයිස්තුගත කර ඇති එවැනි භාණ්ඩ, රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කළ යුතු ය.

4. පරිත්‍යාග ලෙස ලැබිය යුතු අනෙකුත් සියලුම භාණ්ඩ ආනයන, ඉහත රෙගුලාසි අංක 3ට අනුකූලව ක්‍රියාත්මක නොවේ නම් ඒවා පවතින ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මගින් පාලනය වේ.

5. 2019 ජනවාරි 25 දිනැති අංක 2107/45 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2019 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මෙයින් සංශෝධනය කෙරේ.

5.1 ඉහත සඳහන් කළ 2019 අංක 01දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල රෙගුලාසි අංක 3(අ) හි කෙසේ සඳහන් වුවද, සෞඛ්‍ය අමාත්‍යවරයාගේ "1990 සුවසැරිය පදනමට නොමිලේ ප්‍රදාන වශයෙන් ගිලන්රථ ලබා ගැනීම," යන මැයෙන් වූ 2024 ජුනි 18 දිනැති අංක 24/1261/610/048 දරන සංදේශය පිළිබඳව වන 2024 ජූලි 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, 1990 සුවසැරිය පදනමේ ඍජු භාවිතය සඳහා පමණක් වායු බැලූන රහිතව පරිත්‍යාග ලෙස හෝ ප්‍රදාන ලෙස ආනයනය කරනු ලබන ලියාපදිංචි නොකළ (නවතම) ගිලන්රථ රේගු නිෂ්කාශනය සඳහා ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් එච්. එස්. 87 පරිච්ඡේදය යටතේ වර්ගීකණය කර ඇති මෝටර් රථ ආනයනය කිරීමේ දී අදාළ වන අනෙකුත් පවතින නීති රීති වලට යටත්ව අවසර ලබාදිය යුතු ය.

5.2 මෙම රෙගුලාසි යටතේ ලියාපදිංචි නොකළ (නවතම) ගිලන්රථ මුළු සංඛ්‍යාව 150ක් ආනයනය කිරීමට අවසර දෙනු ලැබේ.

5.3 මෙම රෙගුලාසි යටතේ ආනයනය කරන ගිලන් රථ, 1990 සුවසැරිය පදනමේ නමින් ලියාපදිංචි කළ යුතු අතර ආනයන හා අපනයන පාලක ජනරාල්ගේ පූර්ව අනුමැතියකින් තොරව පවරා දීම සිදු කළ නොහැක.

6. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත බලපත්‍රලාභී බැංකු වෙත හෝ වෙනත් අදාළ ආයතන වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතු ය.

7. මෙම රෙගුලාසීන්ට අදාළව පැන නගින කිසියම් ගැටලුවක් සම්බන්ධයෙන් අවසන් තීරණය ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ලබාදිය යුතු ය.

**I වන උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *අයිතමය* | *ශ්‍රී ලංකා ප්‍රමිති* | *එච්. එස්. කේතය* |
|---|---|---|---|
| 1 | සම්පූර්ණ යොදය සහිත කිරිපිටි<br>අඩු යොදය සහිත කිරිපිටි<br>යොදය ඉවත් කළ කිරිපිටි | ශ්‍රී ලංකා ප්‍රමිති 731 කිරිපිටි සඳහා ප්‍රමිති පිරිවිතර | 0402.10<br>0402.21<br>0402.29 |
| 2 | උකුකිරි | ශ්‍රී ලංකා ප්‍රමිති 179 පැණි රස කළ සම්පූර්ණ යොදය සහිත උකුකිරි සඳහා ප්‍රමිති පිරිවිතර | 0402.99.10<br>0402.99.90 |
| 3 | බටර් | ශ්‍රී ලංකා ප්‍රමිති 279 බටර් සඳහා ප්‍රමිති පිරිවිතර | 0405.10 |
| 4 | කිරි සහිත මේද තැවරුම් | ශ්‍රී ලංකා ප්‍රමිති 1428 කිරි සහිත මේද තැවරුම් සඳහා ප්‍රමිති පිරිවිතර | 0405.20<br>0405.90 |
| 5 | පියලි කළ රතු පරිප්පු | ශ්‍රී ලංකා ප්‍රමිති 896 පියලි කළ රතු පරිප්පු සඳහා ප්‍රමිති පිරිවිතර | 0713.40.12 |
| 6 | කහ රෛසෝම / කුඩු | ශ්‍රී ලංකා ප්‍රමිති 613 කහ රෛසෝම / කුඩු සඳහා ප්‍රමිති පිරිවිතර | 0910.30.10<br>0910.30.90 |
| 7 | ආර්. බී. ඩී. සෝයා බෝංචි තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 293 සෝයා බෝංචි තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර | 1507.90 |
| 8 | ආර්. බී. ඩී. පාම් තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 720 පාම් තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර | 1511.90.20<br>1511.90.90 |
| 9 | ආර්. බී. ඩී. පාම් ඔලෙයින් | ශ්‍රී ලංකා ප්‍රමිති 961 පාම් ඔලෙයින් සඳහා ප්‍රමිති පිරිවිතර | 1511.90.90 |
| 10 | ආර්. බී. ඩී. සූරියකාන්ත ඇට තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 946 සූරියකාන්ත තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර | 1512.19 |
| 11 | පොල් තෙල්, ශුද්ධ නොකළ ඒවා හැර | ශ්‍රී ලංකා ප්‍රමිති 32 පොල් තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර | 1513.19.10<br>1513.19.90 |
| 12 | ආර්. බී. ඩී. පාම් මද තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 862 පාම් මද තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර | 1513.29 |
| 13 | ආර්. බී. ඩී. පාම් මද ඔලෙයින් | ශ්‍රී ලංකා ප්‍රමිති 1555 පාම් මද ඔලෙයින් සඳහා ප්‍රමිති පිරිවිතර | 1513.29 |
| 14 | ආර්. බී. ඩී. බඩ ඉරිඟු තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 905 බඩ ඉරිඟු තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර | 1515.29 |
| 15 | තල තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 231 තල ඇට තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර | 1515.50 |
| 16 | මාගරින් ඇතුළු මේද තැවරුම් සහ සංයෝජිත මේද තැවරුම් | ශ්‍රී ලංකා ප්‍රමිති 1427 මේද තැවරුම් සහ මිශ්‍රිත මේද තැවරුම් සඳහා ප්‍රමිති පිරිවිතර | 1517.10.30<br>1517.10.90<br>1517.90 |
| 17 | ටින් මාළු | ශ්‍රී ලංකා ප්‍රමිති 591 ටින් මාළු සඳහා ප්‍රමිති පිරිවිතර | 1604.11<br>1604.12<br>1604.13<br>1604.14<br>1604.15<br>1604.16<br>1604.19 |

| *අනුක්‍රමික අංකය* | *අයිතමය* | *ශ්‍රී ලංකා ප්‍රමිති* | *එච්. එස්. කේතය* |
|---|---|---|---|
| 18 | සුදු සීනි හා අයිසින් සීනි | ශ්‍රී ලංකා ප්‍රමිති 191 සුදු සීනි සඳහා ප්‍රමිති පිරිවිතර | 1701.91.10<br>1701.91.20<br>1701.99.10<br>1701.99.20<br>1701.99.30<br>1701.99.40<br>1701.99.90 |
| 19 | නූඩ්ල්ස්<br>ක්ෂණික නූඩ්ල්ස් | ශ්‍රී ලංකා ප්‍රමිති 1534 ක්ෂණික නූඩ්ල්ස් සඳහා ප්‍රමිති පිරිවිතර | 1902.11<br>1902.19 |
| | මැකරෝනි<br>ස්පැගටි<br>ව(ර්)මිසිරි | ශ්‍රී ලංකා ප්‍රමිති 420 පැස්ටා නිෂ්පාදන සඳහා ප්‍රමිති පිරිවිතර | 1902.20<br>1902.30 |
| 20 | සහල් නූඩ්ල්ස් (සහල් ව(ර්)මිසිලි) | ශ්‍රී ලංකා ප්‍රමිති 858 සහල් නූඩ්ල්ස් (සහල් ව(ර්)මිසිලි) සඳහා ප්‍රමිති පිරිවිතර | 1902.11<br>1902.19<br>1902.20<br>1902.30 |
| 21 | විස්කෝතු සහ කුකීස් | ශ්‍රී ලංකා ප්‍රමිති 251 විස්කෝතු සහ කුකීස් සඳහා ප්‍රමිති පිරිවිතර | 1905.31.10<br>1905.31.90 |
| 22 | වේෆර්ස් | ශ්‍රී ලංකා ප්‍රමිති 1313 වේෆර්ස් සඳහා ප්‍රමිති පිරිවිතර | 1905.32.10<br>1905.32.90 |
| 23 | ජෑම් වර්ග<br>ජෙලි වර්ග<br>මාමලේඩ් වර්ග සහ සංරක්ෂණයන් (දෝසි) වර්ග | ශ්‍රී ලංකා ප්‍රමිති 265 ජෑම්, ජෙලි, මාමලේඩ් සහ සංරක්ෂණයන් සඳහා ප්‍රමිති පිරිවිතර | 2007.10<br>2007.91<br>2007.99 |
| 24 | පලතුරු ස්කොෂ්<br>පලතුරු සිරප්<br>පලතුරු කෝඩියල් | ශ්‍රී ලංකා ප්‍රමිති 214 පලතුරු ස්කොෂ්, පලතුරු සිරප් සහ පලතුරු කෝඩියල් සඳහා ප්‍රමිති පිරිවිතර | 2009.19<br>2009.29<br>2009.39<br>2009.49<br>2009.50<br>2009.61<br>2009.69<br>2009.79<br>2009.81<br>2009.89.10<br>2009.90 |
| 25 | පලතුරු කෝඩියල් සාන්ද්‍රණ<br>පලතුරු ස්කොෂ් සාන්ද්‍රණ<br>පලතුරු සිරප් සාන්ද්‍රණ | ශ්‍රී ලංකා ප්‍රමිති 730 පළතුරු කෝඩියල් සාන්ද්‍රණ, පලතුරු ස්කොෂ් සාන්ද්‍රණ සහ පලතුරු සිරප් සාන්ද්‍රණ සඳහා ප්‍රමිති පිරිවිතර | 2009.11.10<br>2009.11.90<br>2009.19<br>2009.29<br>2009.39<br>2009.49<br>2009.50<br>2009.69<br>2009.79<br>2009.81<br>2009.89.10<br>2009.89.90<br>2009.90 |

| *අනුක්‍රමික අංකය* | *අයිතමය* | *ශ්‍රී ලංකා ප්‍රමිති* | *එච්. එස්. කේතය* |
|---|---|---|---|
| 26 | පිළිගැන්වීමට සූදානම් පරිදි සකසන ලද පලතුරු බීම | ශ්‍රී ලංකා ප්‍රමිති 729 පිළිගැන්වීමට සූදානම් පරිදි සකසන ලද පලතුරු බීම සඳහා ප්‍රමිති පිරිවිතර | 2106.90.49<br>2202.10<br>2202.99.30<br>2202.99.51<br>2202.99.59<br>2202.99.70<br>2202.99.91<br>2202.99.99 |
| 27 | පලතුරු යුෂ සාන්ද්‍රණ සහ පලතුරු යුෂ නෙක්ටා | ශ්‍රී ලංකා ප්‍රමිති 1328 පළතුරු යුෂ සාන්ද්‍රණ සහ පළතුරු යුෂ නෙක්ටා සඳහා ප්‍රමිති පිරිවිතර | 2009.12<br>2009.21<br>2009.31<br>2009.41<br>2009.50<br>2009.61<br>2009.71<br>2009.81<br>2009.89.10<br>2009.89.90<br>2009.90 |
| 28 | කිරි එකතු කරන ලද බීම | ශ්‍රී ලංකා ප්‍රමිති 917 කිරි එකතු කරන ලද බීම සඳහා ප්‍රමිති පිරිවිතර | 2202.99.61<br>2202.99.69 |
| 29 | බෝතල් කරන ලද පානීය ජලය | ශ්‍රී ලංකා ප්‍රමිති 1038 බෝතල් කරන ලද පානීය ජලය සඳහා ප්‍රමිති පිරිවිතර | 2201.90.10 |
| 30 | බෝතල් කරන ලද ස්වභාවික ඛණිජ ජලය | ශ්‍රී ලංකා ප්‍රමිති 894 බෝතල් කරන ලද ස්වභාවික ඛණිජ ජලය සඳහා ප්‍රමිති පිරිවිතර | 2201.10.10 |
| 31 | 1. කාබනිකෘත රස කළ පැණි බීම<br>2. රස කළ හෝ නොකළ කාබනිකෘත වතුර හෝ සෝඩා වතුර<br>3. රස කළ කැෆේ සහිත බීම | ශ්‍රී ලංකා ප්‍රමිති 183 කාබනිකෘත බීම සඳහා ප්‍රමිති පිරිවිතර | 2202.10<br>2202.99.30<br>2202.99.91<br>2202.99.99 |
| 32 | කාබනීකෘත නොවන සංස්ලේෂක/ කෘතීම රසකළ කෝඩියල් හා බීම වර්ග | ශ්‍රී ලංකා ප්‍රමිති 221 කාබනීකෘත නොවන සංස්ලේෂක/ කෘතීම රසකළ කෝඩියල් හා බීම වර්ග සඳහා ප්‍රමිති පිරිවිතර | 2106.90.49<br>2202.10<br>2202.99.30<br>2202.99.40<br>2202.99.91<br>2202.99.99 |
| 33 | කෑමට සුදුසු ලුණු (කැට) | ශ්‍රී ලංකා ප්‍රමිති 79 කෑමට සුදුසු ලුණු (කැට) සඳහා ප්‍රමිති පිරිවිතර | 2501.00 |
| 34 | කෑමට සුදුසු ලුණු (කුඩු) | ශ්‍රී ලංකා ප්‍රමිති 80 කෑමට සුදුසු ලුණු (කුඩු) සඳහා ප්‍රමිති පිරිවිතර | 2501.00 |
| 35 | ළදරුවන් සඳහා වන කොලෝන් | ශ්‍රී ලංකා ප්‍රමිති 589 ළදරුවන් සඳහා වන කොලෝන් සඳහා ප්‍රමිති පිරිවිතර | 3303.00.21 |
| 36 | ළදරුවන්ගේ සම මත ගල්වන පූයර | ශ්‍රී ලංකා ප්‍රමිති 187 ළදරුවන්ගේ සම මත ගල්වන පූයර සඳහා ප්‍රමිති පිරිවිතර | 3304.91 |
| 37 | දන්තාලේප | ශ්‍රී ලංකා ප්‍රමිති 275 දන්තාලේප සඳහා ප්‍රමිති පිරිවිතර | 3306.10 |
| 38 | ඇඟ ගල්වන සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 34 ඇඟ ගල්වන සබන් සඳහා ප්‍රමිති පිරිවිතර | 3401.11.30<br>3401.11.90 |

| *අනුක්‍රමික අංකය* | *අයිතමය* | *ශ්‍රී ලංකා ප්‍රමිති* | *එච්. එස්. කේතය* |
|---|---|---|---|
| 39 | බේදින් බාර් | ශ්‍රී ලංකා ප්‍රමිති 1220 බේදින්බාර් සඳහා ප්‍රමිති පිරිවිතර | 3401.11.90 |
| 40 | ළදරු සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 547 ළදරු සබන් සඳහා ප්‍රමිති පිරිවිතර | 3401.11.30 |
| 41 | රෙදි සෝදන සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 554 රෙදි සෝදන සබන් සඳහා ප්‍රමිති පිරිවිතර | 3401.19.30<br>3401.19.90 |
| 42 | රෙදි සේදීමට ගන්නා කෘතිම ක්ෂාලක කුඩු | ශ්‍රී ලංකා ප්‍රමිති 760 රෙදි සේදීමට ගන්නා කෘතිම ක්ෂාලක කුඩු සඳහා ප්‍රමිති පිරිවිතර | 3402.50<br>3402.90.10 |
| 43 | රෙදි සේදීමට ගන්නා සබන් කුඩු, පෙති හා පතුරු | ශ්‍රී ලංකා ප්‍රමිති 38 රෙදි සේදීමට ගන්නා සබන් කුඩු, පෙති හා පතුරු සඳහා ප්‍රමිති පිරිවිතර | 3401.20.90 |
| 44 | ආරක්ෂිත ගිනි කූරු | ශ්‍රී ලංකා ප්‍රමිති 11 පෙට්ටිවල ඇති ආරක්ෂිත ගිනි කූරු සඳහා ප්‍රමිති පිරිවිතර | 3605.00 |
| 45 | මදුරු දඟර | ශ්‍රී ලංකා ප්‍රමිති 453 මදුරු දඟර සඳහා ප්‍රමිති පිරිවිතර | 3808.59.10<br>3808.61.10<br>3808.62.10<br>3808.69.10<br>3808.91.10 |
| 46 | මදුරු නාශක පෙති (මැට්ස්) | ශ්‍රී ලංකා ප්‍රමිති 930 මදුරු නාශක පෙති (මැට්ස්) සඳහා ප්‍රමිති පිරිවිතර | 3808.59.91<br>3808.61.20<br>3808.62.20<br>3808.69.90<br>3808.91.30<br>3808.91.90 |
| 47 | පාට කිරීමට ගන්නා ක්‍රෙයෝන්ස් සහ පැස්ටල් පාට කූරු | ශ්‍රී ලංකා ප්‍රමිති 777 පාට කූරු ක්‍රෙයෝන්ස් සහ පැස්ටල් පාට කූරු සඳහා ප්‍රමිති පිරිවිතර | 9609.10.30<br>9609.90 |
| 48 | පොලිඑතිලීන් ජල ගබඩා ටැංකි | ශ්‍රී ලංකා ප්‍රමිති 1174 පොලිඑතිලීන් ජල ගබඩා ටැංකි සඳහා ප්‍රමිති පිරිවිතර | 3925.10<br>3925.90 |
| 49 | අභ්‍යාස පොත් | ශ්‍රී ලංකා ප්‍රමිති 382 අභ්‍යාස පොත් සඳහා ප්‍රමිති පිරිවිතර | 4820.20 |
| 50 | කුඩ (නොනමන සහ නමන) | ශ්‍රී ලංකා ප්‍රමිති 1207 කුඩ සඳහා ප්‍රමිති පිරිවිතර<br>1 වන කොටස - නොනමන කුඩ<br>2 වන කොටස - නමන කුඩ | 6601.91<br>6601.99 |
| 51 | පෝසිලේන් හා සෙරමික් පිඟන් භාණ්ඩ (තනි සුදු පමණි) | ශ්‍රීලංකා ප්‍රමිති 1222 පෝසිලේන් පිඟන් භාණ්ඩ සඳහා ප්‍රමිති පිරිවිතර | 6911.10<br>6912.00.10 |
| 52 | ඇලුමිනියම් වලින් නිෂ්පාදිත ගේ දොර පරිහරණය කරන භාජන (මේස උපකරණ හා මුළුතැන්ගේ උපකරණ) | ශ්‍රී ලංකා ප්‍රමිති 69 ඇල්මිනියම් වලින් නිෂ්පාදිත ගේ දොර පරිහරණය කරන භාජන සඳහා ප්‍රමිති පිරිවිතර | 7615.10.90 |
| 53 | විදුලි පංකා සහ යාමක | ශ්‍රී ලංකා ප්‍රමිති 814 විදුලිපංකා සහ යාමක සඳහා ප්‍රමිති පිරිවිතර | 8414.51 |
| 54 | බටවත් ප්‍රතිදීපන පහන් සඳහා වන තුලබරු | ශ්‍රී ලංකා ප්‍රමිති 1150 බටවත් ප්‍රතිදීපන පහන් සඳහා වන තුලබරු පිළිබඳ ප්‍රමිති පිරිවිතර | 8504.10.10<br>8504.10.90 |
| 55 | ප්‍රාථමික කෝෂ සහ බැටරි | ශ්‍රී ලංකා ප්‍රමිති 1198 ප්‍රාථමික කෝෂ සහ බැටරි සඳහා ප්‍රමිති පිරිවිතර | 8506.10.10<br>8506.10.90<br>8506.80 |

| *අනුක්‍රමික අංකය* | *අයිතමය* | *ශ්‍රී ලංකා ප්‍රමිති* | *එච්. එස්. කේතය* |
|---|---|---|---|
| 56 | ජලය උණු කිරීම සඳහා භාවිත ගිල්වීමේ විදුලි ජලතාපක | ශ්‍රී ලංකා ප්‍රමිති 1193 ජලය උණු කිරීම සඳහා භාවිත ගිල්වීමේ විදුලි ජලතාපක සඳහා ප්‍රමිති පිරිවිතර | 8516.10 |
| 57 | විදුලි තාප තැටි | ශ්‍රී ලංකා ප්‍රමිති 1495 විදුලි යමැස්ස, ටෝස්ටර සහ එවැනි අතේ ගෙන යා හැකි පිසුම් උපකරණ සඳහා ප්‍රමිති පිරිවිතර | 8516.60.90 |
| 58 | විදුලි කේතල් | ශ්‍රීලංකා ප්‍රමිති 1501 දියර උණුකිරීම සඳහා වන ගෘහස්ථ හා එවැනි විදුලි උපකරණ සඳහා ප්‍රමිති පිරිවිතර | 8516.79.20 |
| 59 | බටවත් ප්‍රතිදීපන පහන් සඳහා වන දිළියුම් ආරම්භක | ශ්‍රී ලංකා ප්‍රමිති 1260 බටවත් ප්‍රතිදීපන පහන් සඳහා වන දිළියුම් ආරම්භක සඳහා ප්‍රමිති පිරිවිතර | 8536.50.10 |
| 60 | ගෘහස්ථ සහ ඒ හා සමාන පොදු ආලෝකන කාර්යයන් සඳහා වන ටංග්ස්ටන් සූත්‍රිකා ලාම්පු | ශ්‍රී ලංකා ප්‍රමිති 984 ගෘහස්ථ සහ ඒ හා සමාන පොදු ආලෝකන කාර්යයන් සඳහා වන ටංග්ස්ටන් සූත්‍රිකා ලාම්පු සඳහා ප්‍රමිති පිරිවිතර | 8539.22.20<br>8539.22.90 |
| 61 | සාමාන්‍ය ආලෝකකරණය සඳහා ස්වයං බැලාස්ට් ලාම්පු (CFL) | ශ්‍රී ලංකා ප්‍රමිති 1231 සාමාන්‍ය ආලෝකකරණ සේවා සඳහා ස්වයං බැලාස්ට් සහිත ලාම්පු (පූර්ණ ආකාරයේ සංයුක්ත ප්‍රතිදීපන ලාම්පු) සඳහා ප්‍රමිති පිරිවිතර | 8539.31.10 |
| 62 | දිගු රැහැන් / අතේ ගෙන යා හැකි කෙවෙනි පිටවාන් | ශ්‍රී ලංකා ප්‍රමිති 734 ඇම්පියර 13 ජේනු, කෙවෙනි පිටවාන් සහ ඇඩප්ටර් සහ සම්බන්ධිකාරක ඒකක සඳහා පිරිවිතර | 8544.42.91 |
| 63 | දත් බුරුසු | ශ්‍රී ලංකා ප්‍රමිති 276 දත් බුරුසු සඳහා ප්‍රමිති පිරිවිතර | 9603.21 |
| 64 | රික්තක ප්ලාස්කු (උණුසුම් බෝතල්) | ශ්‍රී ලංකා ප්‍රමිති 397 රික්තක උපකරණ, පරිවරණය කරන ලද ප්ලාස්කු, භාජන සහ ජෝගු සඳහා පිරිවිතර | 9617.00.90 |
| 65 | සනීපාරක්ෂක තුවා | ශ්‍රී ලංකා ප්‍රමිති 1732 එක් වරක් පමණක් භාවිත කරන සනීපාරක්ෂක තුවා සඳහා ප්‍රමිති පිරිවිතර<br>ශ්‍රී ලංකා ප්‍රමිති 1749 එක් වරක් පමණක් භාවිත කරන ඉතා තුනී / හීනි සනීපාරක්ෂක තුවා සඳහා ප්‍රමිති පිරිවිතර | 9619.00.10 |
| 66 | මාගරින් ඇතුළු මේද තැවරුම්, සංයෝජිත මේද තැවරුම් සහ බේකරි නිෂ්පාදන සඳහා වන මේද | ශ්‍රී ලංකා ප්‍රමිති 1102 බේකරි නිෂ්පාදන සඳහා වන මේද සඳහා ප්‍රමිති පිරිවිතර | 1517.10.30<br>1517.10.90<br>1517.90 |
| 67 | ළදරුවන්ගේ සමෙහි ආලේපනය කරන ක්‍රීම් සහ දියර | ශ්‍රී ලංකා ප්‍රමිති 742 ළදරුවන්ගේ සමෙහි ආලේපනය කරන ක්‍රීම් සහ දියර සඳහා ප්‍රමිති පිරිවිතර | 3304.99 |
| 68 | ළදරු තෙල් | ශ්‍රී ලංකා ප්‍රමිති 1191 ළදරු තෙල් සඳහා ප්‍රමිති පිරිවිතර | 3304.99 |
| 69 | ළදරුවන්ගේ හිස සේදීම සඳහා භාවිතා වන ෂැම්පු | ශ්‍රී ලංකා ප්‍රමිති 1342 ළදරුවන්ගේ හිස සේදීම සඳහා භාවිතා වන ෂැම්පු සඳහා ප්‍රමිති පිරිවිතර | 3305.10 |
| 70 | වැඩිහිටියන්ගේ හිස සේදීම සඳහා භාවිතා වන ෂැම්පු | ශ්‍රී ලංකා ප්‍රමිති 1346 වැඩිහිටියන්ගේ හිස සේදීම සඳහා භාවිතා වන ෂැම්පු සඳහා ප්‍රමිති පිරිවිතර | 3305.10 |
| 71 | මෘදු සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 37 මෘදු සබන් සඳහා ප්‍රමිති පිරිවිතර | 3401.11.30<br>3401.11.90 |
| 72 | කාබොලික සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 35 කාබොලික සබන් සඳහා ප්‍රමිති පිරිවිතර | 3401.19.30<br>3401.19.90 |

| *අනුක්‍රමික අංකය* | *අයිතමය* | *ශ්‍රී ලංකා ප්‍රමිති* | *එච්. එස්. කේතය* |
|---|---|---|---|
| 73 | දියර සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 1142 ඇඟ ගල්වන දියර සබන් සඳහා ප්‍රමිති පිරිවිතර | 3401.20.90 |
| 74 | ගෘහස්ථ හා කාර්මික කටයුතු සඳහා භාවිතා කරන දියර සබන් | ශ්‍රී ලංකා ප්‍රමිති 1390 ගෘහස්ථ හා කාර්මික කටයුතු සඳහා භාවිතා කරන දියර සබන් සඳහා ප්‍රමිති පිරිවිතර | 3401.20.90 |
| 75 | ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව සමග භාවිත කරන ගෘහස්ථ අඩු පීඩන ගෑස් උඳුන් | ශ්‍රී ලංකා ප්‍රමිති 451 ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව සමග භාවිත කරන ගෘහස්ථ අඩු පීඩන ගෑස් උඳුන් සඳහා ප්‍රමිති පිරිවිතර | 7321.11 |
| 76 | විදුලි සහල් උඳුන් | ශ්‍රී ලංකා ප්‍රමිති 1501 ද්‍රව උණුසුම් කිරීම සඳහා භාවිත විදුලි උපකරණ - සහල් උඳුන් සඳහා ප්‍රමිති පිරිවිතර | 8516.60.10 |
| 77 | සාමාන්‍ය ආලෝකකරණ සේවාවන් සඳහා ආලෝක විමෝචක ඩයෝඩ (LED) ලාම්පු | ශ්‍රී ලංකා ප්‍රමිති 1458 සාමාන්‍ය ආලෝක කරණ සේවාවන් සඳහා ආලෝක විමෝචක ඩයෝඩ (LED) ලාම්පු සඳහා ප්‍රමිති පිරිවිතර | 8539.52 |

EOG 12 - 0017

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.